# ඓතිහාසික ඇඹලව රත්ගල් වෙහෙර - ඇඹුල්ගම

2015 වර්ෂයේ මුල්ම ගවේෂණ කටයුත්ත ලෙස ඇඹුල්ගම රත්ගල් වෙහෙර ආශ්‍රිත ඉතිහාසය සොයා බැලීමට අප තීරණය කළෙමු. මේ එම විහාරස්ථානය පිළිබඳව කෙරෙන ඉතිහාස ගවේෂණයයි.

මෙම සංචාරයේ අරමුණ: ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමානය යුගය දක්වා වූ ඉතිහාස ගවේෂණය
දිනය :2015 ජනවාරි 05 වන දින
සහභාගී වූවන් ගණන: 1 (නිශාන් කුළසිංහ)
ගමන් කල ආකාරය: පොදු මගී ප්‍රවාහන බස් රථ
විශේෂ ස්තූතිය: විස්තර සපයා දුන් ඇඹුල්ගම රජමහා විහාරාධිපති පූජ්‍ය දං කන්දේ බෝධිවංශ හිමිපානන් වහන්සේ
ඡයාරූප: නිශාන් කුළසිංහ
මෙම වාර්තාව සැකසූයේ: නිශාන් කුළසිංහ විසිනි.

**කොළඹ සිට ගමන් මාර්ගය**

හෝමාගම සිට මාර්ග අංක 293 හෝමාගම-හංවැල්ල බසයෙන් පනාගොඩ හන්දිය ඔස්සේ හංවැල්ල දෙසට ගොස්, ඇඹුල්ගම පන්සල අසල බස් නැවතුමෙන් බැස, වම් පසින් පිහිටා ඇති ඇඹුල්ගම රජමහා විහාරයට පැමිණිය හැක. මෙම මහා මාර්ගය දිවෙන්නේ විහාරස්ථානය මැදිනි. කොළඹ-අවිස්සාවේල්ල ලෝ-ලෙවල් මාර්ගය ඔස්සේ පැමිණ ඇඹුල්ගම හන්දියෙන් බැස හෝමාගම මාර්ගය ඔස්සේ මීටර් 800ක් පමණ පැමිණි විට දකුණු පසින් ඉහල පන්සල හමු වේ.

www.LakViskam.org



විහාරයේ පිහිටීම සහ ගමන් මාර්ග

කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය සභාවට අයත් ඇඹුල්ගම රජමහා විහාරය බස්නාහිර පළාතේ හංවැල්ල නගරයට ආසන්නයෙන් පිහිටා ඇත. මාර්ග අංක 293 හෝමාගම - හංවැල්ල බස් මාර්ගය විහිදී යන්නේ මෙම විහාරස්ථානය මැදිනි. මහා මාර්ගයෙන් වෙන්වන විහාරස්ථානයේ පහල කොටස "පහල පන්සල" ලෙසද අනෙක් පස කොටස "ඉහල පන්සල" ලෙසද හඳුන්වයි. ඉහල පන්සලේ ගිරි ශිඛරය තරණය මදක් වෙහෙස ගෙන දෙන්නකි. ඒ සඳහා අත්වැල් සහිත මදක් දුෂ්කර අඩි පාරක් දිගේ යායුතුය. අඩි පාරේ ඇතැම් ස්ථාන ඉතා අවදානම් ලෙස බෑවුමට යොමු වේ. එහෙත් යකඩ වැට සවි කර ඇති නිසා ඒ පිළිබඳව බිය විය යුතු නැත. කෙසේ නමුත් කුඩා දරුවන්ගේ ආරක්ෂාව ගැන සැලකිලිමත් විය යුතුය.

ඔබ එහි යන්නේ නම් සංවර ඇඳුමකින් සැරසී අනවශ්‍ය ලෙස ශබ්ද නොනගා ගමන් කිරීමට මතක තබා ගන්න. අනවශ්‍ය ශබ්ද වලින් එහි සිටිනා බඹරුන් කලබල වී ඔබට පහර දීමට බොහෝ ඉඩ ඇත. එසේම සංවර ලෙස හැසිරීමටත්, පූජා භූමියේ ගෞරවය රැකෙන ලෙස කටයුතු කිරීමටත්, එය අපිරිසිදු නොකිරීමටත් වග බලා ගන්න. ඉහල පන්සල වැඳ පුදා මහා මාර්ගයෙන් අනෙක් පස පිහිටි පහල පන්සලද වැඳ පුදා ගැනීමටද අමතක නොකරන්න.



ඉහළ විහාරයේ පිවිසුම් තොරණ



විහාරාධිපති හිමිපානන්

www.lakviskam.org

රත්ගල් වෙහෙර පර්වතයේ ශ්‍රී ලංකාවේ වියලි හා තෙත් කලාපීය දේශගුණික ලක්ෂණ දක්නට ඇත. ශුෂ්ක කලාපීය ප්‍රදේශ වල වැවෙන පතොක් වැනි ශාකද, මද සිසිලෙන් පිරුණු තෙත් කලාපීය වනාන්තර ස්වභාවයද, නොසිඳෙන සියුම් දිය සීරාවන්ද දක්නට හැක. පර්වත මුදුනේ සිට අවට බැලූ විට නැගෙනහිරින් සිරිපා අඩවිය ඇතුළු කඳු පංතීනුත්,කැළණි ගඟත්, බටහිර දෙසින් කොළඹ නගරයේ උස් ගොඩනැගිලි, වරාය සහ මහා සාගරයත්, දකුණු පසින් මංමාවත් ආදියත්, උතුරු දෙසින් නැවතත් කැළණි ගංගාව, ශේෂ කඳු සහ සාරවත් කෙත් බිම් ආදියත් දැකිය හැක.


පතොක් ශාක


කැළණි ගඟ සහ අවට දසුන්

**ඉතිහාසය**

ඉතාමත් දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන මෙම විහාරස්ථානය හැඳින්වීමට අතීතයේ සිට විවිධ නම් භාවිතා කර ඇති බවට පෙනී යයි. කෛලාසකූට පබ්බතය, අම්බිලි ග්‍රාම වෙහෙර, ඇඹුල්පස වෙහෙර, ඇඹිල්ල වෙහෙර, ඇඹුල්හෙලු වෙහෙර, රත්ගල් වෙහෙර, ඇඹුල්ගම රජමහා විහාරය යන නම් ඉන් ප්‍රධාන වේ. ඇඹුල්ගම යන ග්‍රාම නාමය නිර්මාණය වී ඇත්තේ එකල සියම් මහා නිකායේ මහා නා හිමියන් ඇතුළු රජදරුවන්ට ඇඹුල සැපයූ නිසා බවට අදහසක් ජනප්‍රවාදයේ එයි. දුර්ලභ පිහිටීමක් සහිත මෙම විහාරස්ථානය කැළණි ගඟට ඉතාමත්ම ආසන්නයෙන් සුවිසල් කළුගල් පර්වතයක් ආශ්‍රිතව පිහිටා ඇත. මෙම කළුගල් පර්වතය බැලූ බැල්මට යම් අද්භූත බවකින් පිරි ගිය එකකි. එය මිහින්තලා සෙල් ලිපියෙහි “ලිහිණි පව්ව” නමින් හඳුන්වා දී ඇත. එහි විශාල ලෙන් හා පරිවාර ලෙන් 32ක් පමණ පිහිටා ඇත. මෙම ස්ථානය කැළණි ගඟට ආසන්නයෙන් පිහිටා තිබීම නිසා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ආදී වාසී, මානව ක්‍රියාකාරකම් ලෙන් ආශ්‍රිතව සිදුවන්නට ඇතැයි අනුමාන කල හැක. එහෙත් මෙම ස්ථානයේ පුරාවිද්‍යාත්මක කැනීම් ආදිය සිදු කර නොමැති නිසා මෙතෙක් එවැනි සාක්ෂි මතු කරගෙන නොමැත. අතීතයේ යක්ෂ ගෝත්‍රිකයින් මෙම ප්‍රදේශය අවට ජීවත් වූ බවට සාක්ෂි ඇති නිසා රාවනා රජුගේ කාලයේදීද මෙම ස්ථානය වැදගත් කාර්යභාරයක් ඉටු කරන්නට ඇතැයි විහාරාධිපති පූජ්‍ය පූජ්‍ය දං කන්දේ බෝධිවංශ හිමියන්ගේ අදහසයි.

www.Lakviskam.org


ප්‍රධාන කළු ගල් පර්වතය


ගල් ලෙනක්

පැරණි අංගම් සටන් කරුවන් පවා මෙම ස්ථානය සිය සටන් පුහුණු කටයුතු වලට ප්‍රයෝජනයට ගන්නට ඇතැයි විශ්වාස කල හැක. පැරණි "සුන්දල පූර්ණිකා" ග්‍රන්ථයේ ඇඹුල්ගම විහාරය සහ කොරතොට විහාරය අතර භූමිය යක්ෂ ගෝත්‍රික සටන් ශිල්පීන්ට අයත් බවට සඳහන් වී ඇත. මෑතකදී (2011 වර්ෂයේදී) මෙම පර්වතය මත අංගම් රණකෙලි පූජාවක්ද පවත්වා ඇත. මීට අමතරව විහාරස්ථානයට ඔබ්බෙන් පිහිටා ඇති "එබවල"වැව එකල "එබ වැව" ලෙස හඳුන්වා ඇති අතර රජතුමා වැවෙන් දිය නෑමට ගොස් හිඳ ගත් ගල "කුමාරයා ගල" ලෙස වර්තමානයේද හඳුන්වයි.

කෛලාසකූටය නම් කඳු පර්වතය ශිව දෙවියන්ගේ වාසභවන ලෙස සලකනු ලබයි. හිමෙන් වැසුනු විශාල කන්දක් වන එය ටිබෙට් හී පිහිටා ඇත. ශිවගේ දේව මෙහෙසිය වන පාර්වතී ශ්‍රී ලංකාවේදී පත්තිනි දේවිය ලෙස බොහෝ හින්දු භක්තිකයින් සලකයි. පාර්වතී දේවිය විවාහයෙන් පසු විසුයේ ශිවගේ කෛලාසකූටයේය. ඇඹුල්ගම කෛලාසකූට පබ්බතයද පත්තිනි දේවිය හා සම්බන්ධතාවයක් පවතී. භාරත දේශයේ සිට ලංකාද්වීපයට වැඩම කල පත්තිනි දේවිය කැළණි මිටියාවතට පැමිණ මෙම ස්ථානයේ ලෙනක් තුල භාවනායෝගීව සිටි බවට ජනප්‍රවාදයක් පවතී. දිගින් අඩි 31 වන පත්තිනි ලෙන නම් ලෙනක් මෙහි ඇති අතර මෙම ලෙන තුල පත්තිනි මෑණියන්ගේ දේව ප්‍රතිමාවක් ඉදි කර ඇත.

මහාවංශය හා ධර්ම ප්‍රදීපිකාව නම් ග්‍රන්ථ වල දැක්වෙන පරිදි චුල්ලනාග නම් මහ රහතන් වහන්සේ රත්ගල් වෙහෙරට වැඩමකර ජජක්ක සූත්‍රය දේශනා කල බවත් එය ශ්‍රවණය කිරීමට භික්ෂූන් වහන්සේ 12000 ඇතුළුව යොදුනක් දුරට දෙවියන්ද, ගව්වක් දුරට මනුෂ්‍යයන්ද පැමිණි බවට සඳහන් වේ. පපඤ්ච සූදනිය 1025 පිටුවෙහි දැක්වෙන්නේ ක්‍රි.පු. 500 දී මෙම ස්ථානයේ වැඩ විසූ මහා මලියදේව රහතන් වහන්සේද ජජක්ක සූත්‍රය දේශනා කර ඇති බවයි. මෙම අවස්ථාවේදීද යොදුනක් දුරට දෙවියන්ද, ගව්වක් දුරට මනුෂ්‍යයන්ද එය ශ්‍රවනය කල බවත් සැට නමක් රහත් වූ බවත්සඳහන්ය.


පොළොන්නරුව ගල් විහාරයේ අනුරුව


වැටවල් යොදා ඇති අනතුරුදායක මාර්ගය

චුලෝදර-මහෝදර ආරවුල සමථයකට පත් කිරීම පිණිස දෙවන වරටත් ලක්දිවට වැඩම කල බුදුරජාණන් වහන්සේ ඇතුළු තවත් භික්ෂූන් වහන්සේ 500නමක් කෛලාසකූට පබ්බත ලෙන් වල විශාලතම ලෙන වන රජතමය ලෙනෙහි වැඩ සිටි බවට කරුණු සඳහන් වේ. මෙම තොරතුරු දීපවංශ, මහාවංශ ආදී ආදී ග්‍රන්ථ වල දක්වා තිබී පසුව ඒවා ඉන් ඉවත් කරන්නට ඇතැයි අනුමාන කරනු ලබයි. මෙම ඉවත්කළ තොරතුරු අලලා පසුව ලියන ලද මහාවංශ ටීකාව වන වංසත්ථප්පකාසිනියේ මේ කරුණු සඳහන් වේ. වංසත්ථප්පකාසිනියට අමතරව චේතියවංශ අට්ට කතාවේද, උත්තර විහාරට්ට කතාවේද මේ පිළිබඳව කරුණු සඳහන් වේ. මක්කම සිට වැඩම කල බුද්ධතිස්ස හිමියන් කැළණි විහාරයේ වැඩහුන් භික්ෂූන් වහන්සේ 6000කටත්, සමන්ගිර විහාරයේ වැඩ සිටි භික්ෂූන් 900කටත්, කෛලාසකූට පබ්බතයේ වැඩහුන් භික්ෂූන් 6000කටත් තණ සහලින් සකසා ගත් දානය පිළිගැන්වීම හේතු කොටගෙන කෛලාසකූට පබ්බතය, අම්බිලි විහාරය යන නාමයද පටබැඳී ඇත.




සත් සති විහාරය

ජයශ්‍රී මහා බෝධියේ දෙතිස්ඵල බෝධීන් වන්සේලාගෙන් එක් නමක්, එනම් 32 වන ශාඛාව ඇඹිල්ල වෙහෙරේ රෝපණය කල බවට බෝධිවංශයේ 383 ගාථාවේ සඳහන්ය. පසුකාලීනව කාලිංග, මහමදික, පෘතුගීසි, ලන්දේසි, සහ ඉංග්‍රීසීන් විසින් මෙහි වූ ලෙන් විහාර ආදිය කඩා විනාශ කරන්නට ඇති බවට විශ්වාස කරනු ලබයි (ක්‍රි.ව. 1576දී පමණ දියාගුද මැලෝ නැමැත්තාද පසුව ඉංග්‍රීසීන්ද මෙම විහාරය කොල්ලකා ඇත). දෙතිස්ඵල බෝධීන් වහන්සේද ඔවුන් විසින් විනාශ කරන්නට ඇතැයි සිතිය හැක. බෝධීන් වහන්සේ තිබුනේයැයි සැලකෙන ස්ථානය අවට ඇති ගල් වලවල් මෙම විනාශයට සාක්ෂි දරයි. ඉංග්‍රීසින් විසින් විහාරය සතු ඉඩම් ඔප්පු මගින් වෙනත් අයට පවරා දීමක් කරනු ලැබ ඇතත් එම පැරණි ඉඩම් තෝම්බු වල පැරණි නාමය බෝධිවත්තලෙස දක්වා ඇති බවට දක්නට ලැබේ.

www.LakViskam.org



හිටි පිළිමහන්සේ



මහා ලෙන් වල අද තත්වය

ක්‍රි.ව. 568 දී 1 වන අග්බෝ රජු මෙම විහාරය ඇඹුල්පස ගම් වෙහෙර ලෙස නම් කර විහාරයෙන් ලැබෙන සියළු අදායම් අනුරාධපුර මහා විහාරයට පූජා කල බවට මහාවංශයේ 41 පරිච්ඡේදයේ 18, 19, 20 යන ගාථා වල සඳහන් වේ. එමෙන්ම ක්‍රි.ව. 955-972 කාලයේ 5 වන මිහිඳු රජු (සිරි සංඝබෝධි අභය) විසින් මෙම වෙහෙරේ අදායම මිහින්තලයට පූජා කල බව මිහින්තලා සෙල් ලිපියේ දැක් වේ. ක්‍රි.ව. 1220-1246 කාලයේදී ලංකාවට එල්ල වූ කාලිංග මාඝ ආක්‍රමණ කාලයේ 3 වන විජයබාහු රජතුමා මෙම ප්‍රදේශයට පැමිණ ලෙන් ආදියෙහි විහාරාරාම කරවා

භාවනායෝගී භික්ෂූන් වහස්න්සේට පූජා කළේය. රජු ඇඹුල්ගම වෙහෙරේද ප්‍රධාන ලෙන් 3ක කටාරන් කොටා සකස් කර විහාර කරවා සංඝයා වහන්සේට පූජා කර ඇත. ඉන් එක් ලෙනක සත් සතිය නිරූපණය කර කුසලානගම යන නමින් පූජා කර ඇත.



පුරාණ සත් සති විහාර නටබුන්



කටාරන් සහිත ලෙන්

www.LakViskam.org

ක්‍රි. ව. 1415 දී කෝට්ටේ 6 වන පරාක්‍රමබාහු රජු විසින් නවගමු හල්වක්කඩ කුඹුරුයාය විහාරස්ථානයට පූජා කර ඇත. ක්‍රි.ව. 1796 දී රොබට් ඇන්ඩෘස් ක්ලැක්ටර් ඉංග්‍රීසි නිලධරයා විසින් විහාරයට පොල් ගස් 700ක් සහිත ඉඩම් පුස්කොළ සන්නස් මගින් පවරා දී ඇත. මෙවැනි ඉඩම් පසුකාලීනව විදේශ ආක්‍රමණිකයින් විසින් විනාශ කරන ලදුව වෙනත් අවයලුන් විසින් අල්ලා ගන්නා ලදී.

ක්‍රි.ව. 1525 දී සීතාවක මායාදුන්නේ රජුගේ රාජ අනුග්‍රහයද මෙම ස්ථානයට ලැබුණු බව කියවේ. ශිව ආගම වැළඳගත් ඔහුගේ පුත් පළමුවන රාජසිංහ නොහොත් ටිකිරි බණ්ඩාර කුමරුගේ නියෝගය මත භික්ෂූන් වහන්සේලා විශාල ප්‍රමාණයක් සීතාවක ගඟේ කණාමැදිරියන් වල නම් ගැඹුරු ස්ථානයේ ගිල්වා මැරූ බවට ඇතැම් ලේඛන වල සඳහන්ය. එසේම භික්ෂූන් වහන්සේ 500නමක් මෙම විහාරස්ථානයේ විශාල ගල් ලෙන තුල සිරකර තැබූ බවටද කිය වේ.

පොළොන්නරු යුගයෙන් පසුව කරවූ උස අඩි 5ක් සහ පළල අඩි 3ක් රචනා පේලි 24කින් යුත් එහෙත් දුර්වල මට්ටමේ සෙල්ලිපියක් වන කැරගල සෙල්ලිපියේද ඇඹුල්ගම විහාරය පිළිබඳව සඳහන් වේ. එයට අනුව ක්‍රි.ව. 1335-1341 කාලයේ කුරුණෑගල සිට රාජ්‍ය පාලනය කල 5 වන විජයබා රජු සමයේදී ඇඹුල්ගම විහාරය නටබුන් බවට පත්ව තිබු  නිසා විහාරය අයත් ඉඩම් සහ ඇඹුල්ගම ග්‍රාමයද කුසලාන ග්‍රාමයක් ලෙස කැරගල පද්මාවතී පිරිවෙනට පවරා දුන් බවට සඳහන් වේ.



සියුම් දිය සීරාවක් සහිත තෙත් ස්ථානයක්



පර්වත මුදුනේ ඇති නව බුදුපිළිම වහන්සේ

මෙම විහාරස්ථානයේ ලෙන් අතර යම් අද්භූත බවකින් යුතු ගල්ගුහා 4ක් ඇත. ඉන් එක් ගුහාවක් තුල අප්‍රකටව ඇති දිගින් අඩි දහනවය හමාරක් (19.5) වන සෙල් ලිපියක් ඇති බව කිය වේ. එයට පිවිසීමට ඇති ගුහා කට සම්පූර්ණයෙන් වසා දමා ඇත. තවද ගිරි ශිඛරයේ සිට කැළණි ගඟ දක්වා දිවෙන භූගත උමගක් මෙහි ඇතත් මෙම උමගේ කටද අද වන විට වැසී පවතී. ක්‍රි.ව. 1415-1467 කාලයේදී 6 වන ශ්‍රී පරාක්‍රමබාහු රජු සේනා රැස් කරන සමයේ මෙම උමග කර වූ බවට පැවසේ. එකල ජල භිෂයක් පැවති නිසා ආරක්ෂිතව කැළණි ගඟට ගොස් ජලය ගෙන ඒමට මෙම උමග යොදාගත් බවට කිය වේ. ගිරි ශිඛරයේ සිට කැළණි ගඟේ ගල් කුලක් දක්වා දිවෙන උමගේ උමංකටේ ගල්පඩි, ගඟේ ජලය අඩු කාලයට දිස්වෙන බවට ප්‍රදේශවාසීන් පවසති. මීට අමතරව කොරතොට විහාරය දක්වා දිවෙන උමගක්ද ඇති බවටද ජනප්‍රවාදයක් ඇත. සීතාවක පළමුවන රාජසිංහ රජුද කැළණි ගඟ ආශ්‍රිතව උමං මාර්ග ඉදි කර පෘතුගීසීන්ට පහර දුන් බවට කියවේ.

www.LakViskam.org

**අද්භූත නාග රාජයා**

කලකට පෙර පර්වතය ආසන්නයේ අඳුන් සෑදීම හා බෙහෙත් සඳහා භාවිතා කරන කඳේ ප්‍රමාණය අඩි 20-30ක් පමණ වූ අඩි සිය ගණනක් උසට වැඩුණු දුර්ලභ "රුක් අගුණ" වෘක්ෂයක් තිබී ඇත. පසුව මෙම රුක් අගුණ ගස පහන් දැල්ලකින් ගිනි ඇවිලීම නිසා සම්පූර්ණයෙන් විනාශ වී ඇත. මෙම වෘක්ෂය අසල අඩි 16 කට වඩා දිග පුවක් ගසක කඳට සමාන මහත ශරීරයකින් යුතු විශාල නාග රාජයකු අභ්‍යන්තර ගුහාවක ජීවත් වී ඇත. මෙම නාගයා වර්තමානයේදීද ඉඳ හිට සමහරුන්ට දර්ශනය වන බව පැවසේ. ක්‍රි.ව. 2003 අගෝස්තු මස 12 වන දින පර්වතය මුදුනේ බුදු කුටියට මුල් ගල තබන දින වර්තමාන විහාරාධිපති හිමියන් ඇතුළු පැමිණ සිටි පිරිසට නාගයා විසින් හරින ලද නාග "හැව" දක්නට ලැබී ඇත. මෙම හැව පැරැන්නන් සඳහන් කල හැවට වඩා විශාල මහා නාග හැවක් බවට පිරිස නිරීක්ෂණය කර ඇත.

මීට පෙර විහාරාධිපතිව විසූ ජල්තර ජිනරතන හිමියන් ගිහි කලදී මෙවැනි අද්භූත දේවල් බැහැර කල අයෙක් බවට කියවේ. එකල රුක් අගුණ ගසේ අතුකොල නාගයාට හොරෙන් නිකරුනේ කඩා ගත නොහැක යනුවෙන් ගම්මුන් අතර මතයක් තිබී ඇත. 18 වියේ සිටි ඔහු විසින් මෙම මතයට අභියෝග කිරීමේ අදහසින් කොල කඩා ගැනීමට ගස අසලට ගිය විට නාග රාජයා ඔහු පසුපස පන්නාගෙන පැමිණ තිබේ. නාගයාට බියේ දිව ගිය ඔහු පිටත ගුහාවකට වැටී එයින් ගොඩ එන්නට දින 3ක් තිස්සේ පාර සොයා ගන්නට බැරිව සිටිද්දී ජෝන් පෙරේරා අත්තනායක නැමැත්තා දෙවියන්ට පඬුරක් ගැට ගසා කන්නලව් කිරීමෙන් පසු පාර සොයාගෙන පිටතට ඒමට හැකි වී ඇත.



පර්වත මුදුනේ නාගයකු සහිත හිටි පිළිමය



පිරිනිවන් මංචකය

**බඹර කූඩු**

රත්ගල් වෙහෙරට අයත් විශාල පර්වතය දිගින් අඩි 700ක් හා පලල අඩි 70ක් වේ. විවිධ ප්‍රමාණයේ ලෙන් 32ක් එහි ඇත. විශාලතම ලෙනේ කටට ගල් කඩා වැටී ඇහිරී ඇති බව කියවේ. මෙම පර්වතය ආශ්‍රිතව බඹර කූඩු 60-80ත් අතර ප්‍රමාණයක් තිබු අතර වර්තමානයේ බඹර කූඩු දක්නට ඇත්තේ අල්ප වශයෙනි. මෙම බඹරු කූඩු සම්බන්ධ කතා කිහිපයක්ද ඇත. වර්ෂ 2001 මැයි මස 03 වන දින පූජ්‍ය විටිගල කවිධජ හිමියන් මෙහෙයවන විශේෂ භාවනා වැඩසටහනක් මෙම විහාරස්ථානයේ පැවැත්වීමට කටයුතු සම්පාදනය කර තිබී ඇත. මෙම කාලයේදී පර්වතය ආශ්‍රිතව බැඳ තිබු බඹර කූඩු 20කට වැඩි ප්‍රමාණයක් තිබී ඇත. වැඩසටහනට පැමිණෙන උපාසක උපාසිකාවන්ට බඹරුන්ගෙන් අනතුරක් වීමට ඉඩ ඇති නිසා බාර-හාර වී සත් දිනක් පුරා පිරිත් සජ්ඣායනා කර රිටකින් කූඩු කඩා දමන විට ඇවිස්සුනු ලක්ෂ සංඛ්‍යාත බඹරුන් භික්ෂූන් වහන්සේ වට කර ගත්තත් උන්වහන්සේලාට කිසිදු අනතුරක් නොකර ඉන් ඉවත්ව ගොස් ඇත. එහෙත් වර්ෂ 1971 කැරැල්ලේදී කැරලිකරුවන් සැඟවී ඇත්දැයි පරීක්ෂා කිරීමට ගිය හමුදා සෙබළුන් හට බඹරුන් එලව එලවා පහර දී ඇති අතර ඔවුන් ගලවා ගැනීමට පැමිණි ගම්මුන්ට කිසිදු හිරිහැරයක් කර නොමැති බවට කියවේ. බඹර ප්‍රහාරයට ලක්වූවන්ට නවගමුවේ සුගත බිම්බාරාමයේ සුමනතිස්ස වෙද හිමියන් හා ඇඹුල්ගම විෂ වෛද්‍ය පියදාස මහතා විසින් ප්‍රතිකාර කර ඇත. 1980 වසරේදී දැඩිගමුවේ දස සිල් මාතාවක ඇතුළු සිල්මාතාවන් කණ්ඩායමක් කිල්ලට හසු වී පර්වතය තරණය කර බඹරුන් විසින් දරුණු ලෙස දෂ්ඨ කර දසසිල් මාතාව අභාවයට පත් වී ඇත. මෙය දේව කෝපයක් නිසා සිදු වූ බවට කියවේ.



බඹර කූඩු



මහින්දාගමනය අනුරුව

www.Lakviskam.org

පර සතුරන් හා ස්වදේශීක සතුරන් අතින් විනාශ වී තිබූ විහාරය නැවත ගොඩනැගීමට මූලිකත්වය ගෙන ඇත්තේ වර්තමාන විහාරාධිපති පූජ්‍ය දං කන්දේ බෝධිවංශ හිමියන් සහ හී. ආ. ජිනදාස බාසුන්නැහේ යන දෙදෙනාය. වර්තමාන විහාරාධිපතියන්ගේ අදහසක් අනුව ඉදිකරන ලද හිටි පිළිම වහන්සේ ලෝකයේ පුරිස ධම්ම සාරති මුද්‍රාවෙන් නිරූපණය කර ඇති එකම බුදු පිළිමහන්සේ ලෙස සැලකේ. මෙයට අමතරව මිහින්තලා අනුරුවක්, පිරිනිවන් මංචකය, ගල් විහාරයේ අනුරුව, දිවා ගුහාව, තායි සක්මන් පිළිමය, දේව මන්දිර, දේව පිළිමආදීය විහාර සංවර්ධන කටයුතු යටතේ ඉදිකර සහ ඉදි වෙමින් පවතී. 1967දී සිය ළමා කාලයේ සිට මෙම විහාරස්ථානයට සම්බන්ධ වී 1970දී පැවිදි බිමට පිවිස 1976දී උපසම්පදාව ලැබූ දං කන්දේ බෝධිවංශ හිමියන් ඉතාමත්ම දුෂ්කර දිවියක් ගත කර අප්‍රතිහත ධෛර්යෙන් යුතුව රත්ගල් ගල් වෙහෙර විහාරස්ථානය අද පවතින තත්වයට ගෙන ඒමට කටයුතු කර ඇත්තාහ. මෙම විහාරස්ථානය කේන්ද්‍ර කරගනිමින් වාර්ෂික මහා පෙරහැරක්ද පවත්වනු ලබයි. මෙම විහාරස්ථානයේ ඓතිහාසික පසුබිම සලකා එය ආරක්ෂා කර ගැනීමටත් සංවර්ධනය කටයුතු කිරීමටත් වග කිව යුතු අංශ වල අවධානය යොමු කරන්නේ නම් එය ඉතාමත් අගනා ක්‍රියාවක් වනු ඇත.

*මෙම ගවේෂණ සංචාරයේ තවත් ජායාරූප එකතුවක් පහත යොමුවට පිවිස නරඹන්න. යොමුව නිසි පරිදි ක්‍රියා නොකරයි නම් පහත වෙබ් ලිපින යොමුව ඔබගේ වෙබ් බ්‍රව්සරයට ඇතුලත් කර ජයාරූප නරඹන්න.*

රත්ගල් වෙහෙර ජායාරූප
(https://picasaweb.google.com/102500057347588371605/AmbalawaRathgalVeheraEmbulgama2015?noredirect=1#)

මෙම වාර්තාවේ අයිතිය "ලක් විස්කම්" වෙබ් අඩවිය සතුය. © www.lakviskam.org (18-ජනවාරි-2015)

විමසීම්සහ අදහස්: lakviskam@gmail.com

-මෙම ලිපියේ ඇතැම් කරුණු, විශේෂයෙන් රජවරුන් හා ඔවුන් සිටි කාල සීමාවන් පිළිබඳව ගෙන හැර දැක්වීමේදී අදාල විහාරස්ථානයෙන් අප හට ලැබුණු තොරතුරු මත පදනම්ව ඒවා ඉදිරිපත් කර ඇත. එම කාල වකවානු වර්තමාන සම්මතයේ තිබෙන කරුණු සමග පරස්පරතා තිබිය හැක-

www.LakViskam.org